සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක **25/2026**

මගේ අංකය - PPSC/ES/10/FI/06/01-1
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත - රත්නපුර.
2026.07. 23

**01. ප්‍රධාන ලේකම් - සබරගමුව පළාත් සභාව**
**02. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් - සබරගමුව පළාත් සභාව**

**සබරගමුව පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියට නියමිත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවීම - 2026**

සබරගමුව පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ සේවය කරන නිලධාරීන්ගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය ඔබ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල සේවයේ නියුතු සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ නියුතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ගේ **දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.** මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියෙහි (www.psc.sg.gov.lk) සහ සබරගමුව පළාත් වෙබ් අඩවියෙහි (www.sg.gov.lk ) ද පළ කර ඇත.

02. බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂයය නිර්දේශය පහත සඳහන් කර ඇති පරිදි වන අතර ඒ සඳහා ලිඛිත පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ විධිවිධාන සම්බන්ධයෙන් රජයේ නිලධාරියා සතු සාමාන්‍ය දැනුම එම දැනුම ප්‍රායෝගික භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම මෙහි අපේක්ෂාව වේ. **ආයතන සංග්‍රහයෙහි I වැනි හා II වැනි කාණ්ඩයන්හි අඩංගු පරිච්ඡේද වලින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.** | පැය 02 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | රජයේ කාර්යාලවල භාවිතා වන මුදල් රෙගුලාසි පිළිබඳව දැනුම හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය හා ගබඩාකරණය පිළිබඳ දැනුම මැනීම අපේක්ෂා කෙරේ. | පැය 02 | 100 | 40 |

- එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට හැකිවේ.

03. **විභාගයට අයදුම් කිරීම :-** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතු අතර ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් **2026.08.23** දින හෝ එදිනට පෙර ලැබෙන සේ **" ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නව නගරය, රත්නපුර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **අයදුම්කරුවන් ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මා දැනුවත්** කරන මෙන් කාරුණිකව දන්වමි.

04. මින් පෙර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී නැවත අයදුම් කරන්නේ නම් එක් විෂයකට රු. **250/-** ක් හා සමස්ත විභාගය සඳහා රු. **600/-**ක විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැර වන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැළවෙන සේ ඇලවිය යුතු ය.

05. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට විභාගය පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

06. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර හෝ කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

# ආදර්ශ අයදුම්පත

**සබරගමුව පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියට නියමිත පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම්පත් කැඳවීම - 2026**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(කොටුව තුළ අදාළ අංකය ලියන්න )

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම: -..........................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

02. මුල'කුරු සමඟ නම : -..................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

03. සේවය කරන කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ /ආයතනයේ නම :-.......................................................
..........................................................................................................................

04. රාජකාරී ලිපිනය :- ..........................................................................................................
..........................................................................................................................
(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

05. දුරකථන අංකය :- 1. රාජකාරී ...................................
2. පෞද්ගලික...............................

06. ස්ත්‍රී / පුරුෂ භාවය :-........................................

07. ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

08. දැනට දරන තනතුර:-..........................................................................................................

09. එම තනතුරේ පත්වීම් දිනය :-...............................................................................................

10. විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයය: - 01..............................................................
02..............................................................

11. ඔබ විභාගයට ඉල්ලුම් කරන්නේ ප්‍රථම වතාවටද : - ඔව් / නැත

12. එසේ නොවන්නේ නම්, විභාග ගාස්තු ගෙවා ලබාගත් (අමුණා ඇති) මුදල් භාරගැනීමේ කුවිතාන්සියේ ,

අංකය: - ....................................     මුදල: - ............................................

දිනය : -......................................     විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :-.................................

මුදල් භාරගැනීමේ කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න
( කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

13. **අයදුම්කරුගේ සහතිකය :-**

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

.........................................
අයදුම්කරුගේ අත්සන

දිනය ................................

14. **දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත නම් සඳහන් අයදුම්කරු මෙම කාර්යාලයේ සේවය කරන තොරතුරු සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියේ නිලධාරියෙකු බවත් ඔහු විසින් සපයා ඇති ඉහත තොරතුරු පුද්ගලික ලිපිගොනුවේ සඳහන් තොරතුරු අනුව නිවැරදි බවත් ඔහු /ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති අයෙකු බවත්, ඔහු /ඇය මා ඉදිරියේදී මෙම අයදුම්පත්‍රයේ අත්සන් තැබූ බවත් මින් සහතික කරමි. ඉහත නම් සඳහන් අපේක්ෂකයාට විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති /නැති බව නිර්දේශ කරමි.

(නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න.)

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

...........................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

දිනය -.............................